④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1567/23 - 2008 සැප්තැම්බර් 19 වැනි සිකුරාදා - 2008.09.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින් මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය ඇතිව, කලින් කළ සංශෝධිත රුහුණු විශ්වවිද්‍යාලය හා සම්බන්ධව 1984 ජනවාරි මස 24 වන දින හා අංක 281/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගය, එහි (iv) වන සහ (v) වන ඡේද, එම ඡේදවලට ඉක්බිතිවම ඇති I වන සහ II වන තීරුවල ඇති සටහන් ද සමඟ ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" (iv) පහත දැක්වෙන අධ්‍යයන අංශ එකී විශ්ව විද්‍යාලයට පවරා දෙමි.-

(අ) කෘෂිකාර්මික පීඨය;

(ආ) ඉංජිනේරු පීඨය;

(ඇ) ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය;

(ඈ) මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය;

(ඉ) කළමනාකරණ හා මූල්‍ය පීඨය;

(ඊ) වෛද්‍ය පීඨය; සහ

(උ) විද්‍යා පීඨය; සහ

(v) මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ I වන තීරයෙන් විශ්වවිද්‍යාලයට (iv) වන ඡේදය යටතේ පවරා ඇති එකී විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨ, II වන තීරයේ එකී එක් එක් පීඨවල අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු බවට නිශ්චිතව සඳහන් කරමි.

1A - G 010242 — 940 (2008/09)

**උපලේඛනය**

| *1 වන තීරය*<br>*පීඨය* | *2 වන තීරය*<br>*අධ්‍යයන අංශය* |
|---|---|
| කෘෂිකර්ම පීඨය | 1. කෘෂි ජීව විද්‍යා අධ්‍යයනාංශය<br>2. කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය<br>3. කෘෂි ඉංජිනේරු අධ්‍යයනාංශය<br>4. පශු විද්‍යා අධ්‍යයනාංශය<br>5. භෝග විද්‍යා අධ්‍යයනාංශය<br>6. ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය<br>7. පාංශු විද්‍යා අධ්‍යයනාංශය |
| ඉංජිනේරු පීඨය | 1. සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශය<br>2. විද්‍යුත් හා තොරතුරු ඉංජිනේරු අධ්‍යයනාංශය<br>3. විෂයාන්තර අධ්‍යයනාංශය<br>4. යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශය |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | 1. ධීවර හා ජලජීවී වගා පිළිබඳ අධ්‍යයනාංශය<br>2. සාරස විද්‍යා අධ්‍යයනාංශය<br>3. සාගර විද්‍යා හා සාගර භූ විද්‍යා අධ්‍යයනාංශය |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය<br>2. භූගෝල විද්‍යා අධ්‍යයනාංශය<br>3. ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය<br>4. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය<br>5. සිංහල අධ්‍යයනාංශය<br>6. සමාජ විද්‍යා අධ්‍යයනාංශය |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | 1. ගණකාධිකරණ සහ මූල්‍ය අධ්‍යයනාංශය<br>2. කළමනාකරණ හා ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය<br>3. වෙළඳ කටයුතු අධ්‍යයනාංශය |
| වෛද්‍ය පීඨය | 1. කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය<br>2. ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය<br>3. ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>4. අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>5. වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>6. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය<br>7. ධාත්‍රික ශෲත විද්‍යා හා නාරිවේද අධ්‍යයනාංශය<br>8. පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය<br>9. ව්‍යාධි නිධාන විද්‍යා අධ්‍යයනාංශය<br>10. ළමා රෝග වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>11. භිෂග්වේද විද්‍යා අධ්‍යයනාංශය<br>12. කායික විද්‍යා අධ්‍යයනාංශය<br>13. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>14. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| විද්‍යා පීඨය | 1. උද්භිද විද්‍යා අධ්‍යයනාංශය<br>2. රසායන විද්‍යා අධ්‍යයනාංශය<br>3. පරිගණක විද්‍යා අධ්‍යයනාංශය<br>4. ගණිත අධ්‍යයනාංශය<br>5. භෞතික විද්‍යා අධ්‍යයනාංශය<br>6. සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය.". |

මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2008 සැප්තැම්බර් මස 10 දින.
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07.

10 - 191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1569/10 - 2008 සැප්තැම්බර් 30 වැනි අඟහරුවාදා - 2008.09.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)




### නිවැරදි කිරීමයි

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

2008.09.19 වැනි දින අංක 1567/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ I වැනි කොටස : (I) වැනි ඡෙදය ආණ්ඩුවේ නිවේදනහි ඉහත මාතෘකාව යටතේ පළවූ දැන්වීමෙහි සිංහල භාෂා කොටසෙහි උපලේඛනයේ I වැනි තීරයේ වෛද්‍ය පීඨයට අදාළව දක්වා ඇති 7 වැනි අධ්‍යනාංශය මුද්‍රණය වී ඇත්තේ “ ධාත්‍රික ශෘත විද්‍යා හා නාරිවේද අධ්‍යනාංශය ” යනුවෙනි. එය “ ධාත්‍රික හෘත විද්‍යා හා නාරිවේද අධ්‍යනාංශය ” ලෙස නිවැරදි විය යුතුය.

මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2008 සැප්තැම්බර් මස 23 වැනි දින,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

10 - 404